*There is only one happiness in this life, to love and be loved. ..*



# මගේ ලෝකය

# ඔහුගේ සිහිනයක් සැබෑ කළෙමු

ජූනි මාසයට ඩීබී කුරුප්පු නම් වූ දැවැන්ත ලේඛකයා අප අතැර ගොස් වසර දෙකක් පිරෙයි. ඒ වසර දෙක ඔහු තබා ගිය හිස්තැන අපට මොනවට පසක් කළ වසර දෙකක් විය.

මට ඔහු හමුවන්නේ වසර 2000 දී පමණ යයි සිතමි. උතුරු මෙල්බනයේ රෙසවෝහි පිහිටි පැරඩයිස් ශ්‍රී ලාංකික ග්‍රොසරියේදී ය. සතියකට වරක් බඩුමුට්ටු ගන්නට යන ගමනේදී එක් දිනෙක කෙට්ටු උස මැදිවියේ අයෙකු කවුන්ටරය අසළ සිටගෙන සිටිනු මම දුටුවෙමි. කලින් ඔහුගේ සේයා රූ දැක තිබුණ බැවින් මේ ඩීබී කුරුප්පු මහතා බව හඳුනා ගත්තෙමි.

"කුරුප්පු අංකල්.. මේ ජගත්.. මෙයත් පොත් ලියනවා" කවුන්ටරයේ සිටි ඔල්ගා කරවිදෙණිය මා හඳුන්වාදුන්නේ එසේ ය. කුරුප්පු මහතා මා දෙස ඕනෑවට එපාවට මෙන් බැල්මක් හෙලුවේ ය. මට ඒ බැල්ම ඇල්ලුවේ නැත. මම ද එවන්ම වූ බැල්මකින් ඔහුට සංග්‍රහ කළෙමි. එපමණකි. අප අතර එකම එක වචනයක් හෝ හුවමාරු නොවුණි.




"ඒ වෙලාවෙ මං ජගත්ව ගණන් ගත්තෙත් නෑ... ජගත් මාව ගණන් ගත්තෙත් නෑ" පසු කලෙක ඔහු ඒ සිදුවීම සිහිපත් කරමින් කීවේ මහ හඬින් සිනාසෙමින් ය.

මුල් හමුවීම එසේ වුවත් පසු කලෙක අපි ඉතා සමීප වූයෙමු. ඔහුත් මාත් අතර සිදුවූ යම් යම් ගනුදෙනු සම්බන්ධව මා ලිපි පෙළක්ම මගේ "මානව" බ්ලොග් අඩවියේ (https://maanawa.blogspot.com) ලියා ඇති බැවින් ඒවා නැවත මෙහි ලියන්නට අදහස් නොකරමි.

අප අතර වූ සාහිත්‍ය ගනුදෙනුවේ දී සිදුවූ බොහෝ දේ වැදගත් ය. අපට නොවේ. සමාජයට ය. පහන පුවත්පතේදී අපි එක්ව සාහිත්‍ය තරගයක් සංවිධානය කළෙමු. ඉන්පසු සන්නස පුවත්පතේදීත් එවැනිම තරගයක් සංවිධානය කළෙමු. මේ දෙවතාවම ඕස්ට්‍රේලියාවේ සිට නිර්මාණකරණයේ යෙදෙන්නන් සඳහා පමණක් විවෘත විය. දෙවන අවස්ථාවේදී ජයග්‍රාහී කෙටිකතා එක්කර " පළමුවැනි තෑග්ග" නමින් කෙටිකතා සංග්‍රහයක්ද නිකුත් කළෙමු. ලංකාවේ මුද්‍රණය කළ පොත් ගෙන්වාගැනීමට මුදල් හිඟවී සිටි අවස්ථාවේදී ඒ සඳහා මුදලක් දුන්නේද ඩීබී ය.

මේ තරගාවලිය මෙතැනින් ඔබ්බට ගෙන යාමට අපට අවශ්‍ය විය. අවසන් කාලයේ ඩීබීත් මාත් සාකච්ඡා කරමින් සිටියේ ඒ ගැන ය. ඒ සැළසුම ක්‍රියාත්මක කරන්නට පෙර ඔහු යන්නට ගියේ ඒ බර මට පමණක් ඉතිරි කරමිනි.

එදා මා සිටියේ මෙල්බනයෙන් බොහෝ දුර පිහිටි කොලැක් හි රෝහලක ය. හිමිදිරි පාන්දර මගේ දුරකතනය නාදවෙයි. මුහුණතේ දිස්වන්නේ බන්දු දිසානායකයන්ගේ දුරකතන අංකයයි.

"ඩීබී ගියා මල්ලි" ඔහු ඒ අප්‍රසන්න හිමිදිරියේ දුරකතනයෙන් කී හැටි කෙසේ අමතක කරන්නද?

"කරදරයක්ද?" මගේ කඳුලින් පිරී ඇති දෑස් දකින රෝහලේ සේවකයෝ අසති.

"මගේ ඥාතියෙක් මියගිහින්" මම කීවෙමි.

ඩීබී ඉතිරිකර ගිය කෙටිකතා තරගය පිළිබඳ විසල් බර දරාගනිමින් මේ කර්තව්‍යය සඳහා විවිධ අය යොමු කරන්නට මහන්සි වූයෙමි. විවිධ හේතු මත ඒ කටයුත්ත දවසින් දවස කල් යමින් තිබුණි. කිසිවකුට දොස් කීමෙන් පළක් නැත. මේ කටයුත්තේ බර මා ම දරා ගන්නට මම අවසන තීරණය කළෙමි. ඩීබී වෙනුවෙන් කළ යුතු මේ කර්තව්‍යය මගහැර යන්නට මට නොහැකි ය.

මගේ සහයට සිටියේ ගාමිණී පැළෑඳ සහ විජිත දෙල්ගම සොහොයුරන් සහ නමින් ඉදිරිපත්වන්නට අකැමැති වූ තවත් දෙදෙනෙකුත් පමණකි. අපි "ඩීබී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගාවලියේ සංවිධායක මණ්ඩලය" නොනිළ වශයෙන් පිහිටුවා ගතිමු. වෛද්‍ය නිර්මලී ජයසිංහ මහත්මියත් අතිල් ගුණසේකර මහතාත් නිර්නාමිකව සිටින්නට අදහස් කළ තවත් කීප දෙනෙකුත් ත්‍යාග සඳහා අනුග්‍රහය දක්වන්ට ඉදිරිපත්වීමත් සුජිත් කුරේ සහ විජිත දෙල්ගම කෙටිකතා පොත මුද්‍රණය කරන්නට අනුග්‍රහය දැක්වීමත් අපට විශාල ශක්තියක් විය.

තරගය පිළිබඳ පණිවුඩය ප්‍රධාන වශයෙන් අන්තර්ජාලය හරහා යැවුණ අතර ඔස්ට්‍රේලියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය රැසක් ඒ පණිවුඩය ගෙනයන්නට අපට සහය වීම අමතක නොකරමු. ප්‍රචාරය ඇරඹුන සැණින් ලොව දසතින් කෙටිකතා ගලා එන්නට විය. කෙටිකතාව ජනප්‍රිය නැතැයි මැසිවිලි නැගෙන කාලයක මේ ප්‍රතිචාරය අප විස්මයට පත් කරන්නට සමත් විය. විනිශ්චය මණ්ඩලයේ කටයුතු කරමින් අපට සහය දැක්වූ ප්‍රවීණ ලේඛකයන් වන අනුරසිරි හෙට්ටිගේ, කපිල එම් ගමගේ, ආචාර්ය පාලිත ගනේවත්ත මහත්වරුන් සහ ප්‍රවීණ ලේඛිකා ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මිය දැඩි අපහසුතා මැද මේ කෙටිකතා කියවා සිය විනිශ්චය ලබා දුන් ආකාරය පැසසුම් තටයුතුය.

මාර්තු 26 වනදා නාරාහේන්පිට ගෞතම විහාරයේදී ජයග්‍රාහක ජයග්‍රාහිකාවනට ත්‍යාග සහ සහතිකපත් බෙදා දෙන්නට අපට හැකි විය. ජය සංකේතය නිර්මාණය කර අනුග්‍රහය දැක්වූ අතුල උපසිරි කල්දෙමුල්ල ත්‍යාග ප්‍රදානය සංවිධානය කළ ගාමිණී සමරසිංහ සහ කැලුම් පාලිත මහීරත්න සොහොයුරන්ද නොපැකිළ අපට අත දුන් ගෝතම විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ ද අමතක නොකළ යුතුය.

අවසන් වශයෙන් ඩීබී සිහි කරමින් සහ කෙටිකතා සංග්‍රහය මෙල්බන් වාසී සැමට පුද කරමින් උතුරු මෙල්බනයේ ග්ලැඩ්ස්ටන් පාක්හි සීනියර් සිටිසන් සෙන්ටර් හිදී සුහද හමුවක් පවත්වා සැමට ස්තූති කරන්නට අපට හැකි වීම මහත් සතුටකි. ග්ලැඩ්සටන්පාක් වැඩිහිටි සංගමයත් ගාමිණී පැළෑඳ, විජිත දෙල්ගම, විජේරත්න රාජකීර්ති, විජිත දේවගේ, තිලකා ගම්ලත්, අරුණ විජේසිංහ, මහීල් මුණිදාස, නිහාල් සිරිවර්ධන, තේජා පෙරේරා, දයාන් රණසිංහ යන හිතවතුන් සහ හිතවතියන් දුන් සහයද වැදගත් ය. උත්සවයට එක්වූ ඩීබීගේ බාල දියණිය සුභාෂිණී කුරුප්පු සොයුරියටත් ඩීබී සිහිපත් කරමින් දේශන පැවැත්වූ බන්දු දිසානායක, විජය කරුණාසේන, මහින්ද දිසානායක, බණ්ඩාර පතිරණ, ජගත් වෙත්තසිංහ සොයුරන් රුවන්ති විජේසිංහ දියණිය ලංකාවේදීත් මෙල්බනයේදීත් උත්සව සභාව මෙහෙයවූ නාමල් කුරුකුලරත්න සොයුරාත් උත්සවයට සහභාගි වූ සියල්ලෝත් අපේ මතකයේ රැඳී සිටිති.




ඩීබී වෙනුවෙන් අපි එක් පියවරක් හමාර කළෙමු. මේ සියල්ල ඉතා සුව පහසුවෙන් සිදු නොවූ බව අමුතුවෙන් ලිවිය යුතු නැතැයි සිතමි. බාධක ගැටළු අපමණ විය. කකුලෙන් ඇදීම්, සිත් රිදවීම් අපමණ විය. අපි ඉතා ඉවසීමෙන් ඒ සියල්ලටම මුහුණ දුන්නෙමු. ඒවා අත්දැකීම් ලෙස පමණක් හඳුනා ගත්තෙමු.

"කුරුප්පු අංකල්.. ඔන්න ඔබේ සිහිනයක් අපි සැබෑ කළා" යයි දැන් අපට කිව හැකි ය. ඔහු යම් තැනක සිටිත් නම සතුටු වනු ඇත.

දැන් ඇත්තේ මෙතැනින් ඉදිරියට යාමයි. ඒ ගමන යන්නට ඇවැසි සහයෝගය දැනටම ලැබෙමින් පවතියි. අපමණ සතුටකි.



ජගත් ජේ එදිරිසිංහ

## ආදරය










ජීවිතය පුරා හදවත සූරා දමන මහත් වූ වේදනාවක් ජනිත කරන්නේ නොලද ප්‍රේමය යි. නොලද ප්‍රේමය පමණක් නොවේ. පෙම් කළ පෙම්වතිය නොලැබීමද එයට අයත් ය. ඒ ප්‍රේමයේ වේදනාව වෙනත් ආකාරයකින් ඩීබී විඳිමින් සිටියා ද? මා විශ්වාස කරන්න. ඔහු අවසන් හුස්ම හෙළණ තෙක්ම ඒ වේදනාව රහසින් විඳිමින් සිටියේ ය.

ඔහු ගොළු හදවත නවකතාවේ තුන් කොන් ප්‍රේමයේ එක කොණකි. අනෙක් කොන් දෙක කතාව ලියූ කරුණාසේන ජයලත් සහ ඔවුන් දෙදෙනාගේම ප්‍රේමයට පාත්‍ර වූ යුවතිය පද්මා ත් ය. තමා සිතින් පෙම් කළ යුවතිය තමාගේ හොඳම මිතුරා සමග පෙමින් වෙලී ඇති බව දැනගන්නා ජයලත්ගේ සිතේ ඇති වූ වේදනාව කොපමණ වන්නට ඇතිද?

"එදා ජයලත් මගේ අත්දෙක අල්ලගෙන හොඳටම ඇඬුවා" යි ඩීබී මට කියන විම ඔහුගේ දෑස් තුළ ඒ වේදනාව මම දුටුවෙමි.

"ඇයි අංකල් එයාව බැන්දෙ නැත්තෙ?" මා අසනවිට ඒ දෑස් තුළ වේදනාව පිරෙන හැටි මම දැක ඇත්තෙමි.

"මම ඉගෙනගත්ත කොළඹ ආවට පස්සෙ ඒක ඉබේම නැවතුණා" යි ඔහු කියන විට හෙළූ සුසුමේ ඒ වේදනාව සැඟව තිබූ සැටි මම දුටුවෙමි.

කිසිවකුට නොකියන කිසිවකු නොදකින කොපමණ වේදනා අපි සඟවාගෙන සිටින්නෙමුද කියා මම ඔහුගෙන් නැසුවෙමි.

හැම අදහසක්ම වචන වලින්ම ඇසිය යුතු නැත.